052907
2015/07/21
ML/PR
J-825

# ශ්‍රී ලාංකේය ආදිවාසී ජනතාවගේ නවීකරණ ක්‍රියාවලිය
## (දඹාන ගම්මානය ඇසුරෙනි)

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය,
ඇල්බට් චන්ද්‍රවංකය,
කොළඹ 07.

## සංක්ෂිප්තය

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ජන කොට්ඨාශ අතුරින් වඩාත් ප්‍රසිද්ධියක් උසුලන්නේ ආදි ජනතාවය.මෙම ජන කොට්ඨාශය නවීකරණයත් සමඟ විශාල පරිවර්තනයකට ලක්වෙමින් පවතී. ආහාර, ඇඳුම්, නිවාස වැනි මූලික මිනිස් අවශ්‍යතා පමණක් නොව පිළිසිඳ ගැනීමේ සිට උපත් චාරිත්‍ර, මල්වරවීම, විවාහය, අවමංගල්‍ය කටයුතු හා සම්බන්ධ සියලු චාරිත්‍රවාරිත්‍ර ද මහ සමාජයට අනුගත වෙමින් සපුරා ගන්නා අයුරු විද්‍යමාන වේ. මාගේ නිබන්ධය තුළින් එම සමාජ සංස්කෘතික වෙනස්වීම හා එම වෙනස්වීමේ ක්‍රියාවලියට ආදිවාසිකයා අනුගත වෙමින් පවතින අන්දම හඳුනා ගැනීමට උත්සහ දරන ලදී. ඒ සඳහා අධ්‍යන ක්ෂේත්‍රය වශයෙන් දඹාන ආදිවාසී ගම්මානය තෝරා ගන්නා ලදී.

මෙම පර්යේෂණයට අදාලව සකස් කරන ලද නිබන්ධය පරිච්ඡේද හයකින් සමන්විත වේ. පළමු පරිච්ඡේදය තුළින් නිබන්ධය හා එහි සැලැස්ම ද ආදිවාසී ජනතාව පිළිබඳ සාහිත්‍ය විමර්ශනය දෙවැනි පරිච්ඡේදයෙන් ද විස්තර කෙරේ. පිළිසිඳ ගැනීමේ සිට උපත, මල්වරවීම, විවාහය, අවමගුල් කටයුතු ආශ්‍රිත සිරිත්විරිත් නූතන සමාජයට අනුගතව ඉටුකර ගන්නා අයුරුත් , මූලික මිනිස් අවශ්‍යතා ඉටු කර ගන්නා අයුරුත් විමසුමට ලක් කෙරේ.ක්‍රියාකාරීව දේශපාලනයට සම්බන්ධ නොවූ ආදිවාසිකයා වර්තමානයේ ක්‍රියාකාරී දේශපාලනයට සම්බන්ධ වන අයුරු ද විද්‍යමාන වේ. ආදිවාසී ජන ජීවිතය කෙරෙහිවන දේශපාලන බලපෑම පස්වන පරිච්ඡේදයෙන් ද මේ සියලු නවීකරණයන් තුළ මුහුණදෙන සමාජ ගැටලු පිළිබඳව ද අවසන් වශයෙන් විස්තර කොට ඇත. එමෙන්ම සමාලෝචනයක් සහිත නිගමනයකින් ද මෙම නිබන්ධය සමන්විත වේ.